# අපිටම රැවටෙන අපි

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය

කවුරු හරි කියනවනං 'මේ ජීවිත කාලෙටම කාගෙවත් රැවටීමකට අහුවෙලා නැහැ කියලා, කවුරුවත් තමන්ව රවට්ටල නැහැ කියලා ඇත්තටම ඒක පිළිගන්න පුළුවන් සත්‍යයක් නෙවෙයි. අපි කවුරුත් කාට හරි එක වතාවකට හරි රැවටිලා තියෙනවා. කාගේ හරි රැවටීම් වලට අපි අසුවෙලා තියෙනවා වගේම සමහර විට



අපේ රැවටීම් වලට තව කවුරු හරි අහුවෙලා තියෙනවා. කෙනෙක්ව රැවටීමෙන් ඒ තුළින් හුඟාක් අය ලාභ ප්‍රයෝජන ලබා ගන්නවා. සමහර රැවටීමට අසුවෙන පුද්ගලයා දන්නවා තමන් රැවටෙන බව. ඒත් මොකක් හෝ අවාසනාවකට තමන් රැවටෙන බව පිළිගන්න ඔවුන් කැමති වෙන්නේ නැහැ. ඒ වගේම රැවටෙන බව නොදැන රැවටෙන පිරිස වැඩියි. එහෙම වුණාම ඒ රැවටීම තුළින් සමහර විට තමන්ට මහා පරිමාණයෙන් නොවුණත් පාඩු සිද්ධ වෙන්නත් පුළුවන්. සමහර විට සමහර රැවටීම් වලට අසුවෙන උදවියගෙ ජීවිතයට පවා තර්ජන එල්ල වෙන අවස්ථා තියෙනවා. ඒ නිසාම ජීවිත නැති කරගන්න පෙළඹෙන අවස්ථාවල් වගේම ජීවිතවලින් වන්දි ගෙවන්න වෙන අවස්ථාවලුත් අපේ රටේදී බහුලව අහන්නට දකින්නට ලැබෙනවා.

තරුණ වියේදි හුඟක් පෙම්වතුන්, පෙම්වතියන් අනෙකාගේ රැවටීම් වලට අසුවෙනවා. ගමෙන් නගරයට රැකියාවක් සඳහා එන බොහෝ යුවතියන් සමහර විට තරුණයන් පවා මෙවැනි අත්දැකීම් ලබනවා. නමුත් ප්‍රේමය බිඳෙයි කියන බයට; තමන්ට වේදනාකාරී අත්දැකීමක් ඉතිරි වෙයි කියන සැකයට ඔවුන් ඒ රැවටීම, රැවටීමක් ලෙස සලකන්නෙ නැහැ. ඒ වුණත් කෙළවරදි ඊටත් වඩා වැඩි වේදනාවක් තුරුළු කර ගන්නට සිද්ධ වෙනවා.

තරුණ වියේදි හුඟක් පෙම්වතුන්, පෙම්වතියන් අනෙකාගේ රැවටීම් වලට අසුවෙනවා. ගමෙන් නගරයට රැකියාවක් සඳහා එන බොහෝ යුවතියන් සමහර විට තරුණයන් පවා මෙවැනි අත්දැකීම් ලබනවා. නමුත් ප්‍රේමය බිඳෙයි කියන බයට; තමන්ට වේදනාකාරී අත් දැකීමක් ඉතිරි වෙයි කියන සැකයට ඔවුන් ඒ රැවටීම, රැවටීමක් ලෙස සලකන්නෙ නැහැ. ඒ වුණත් කෙළවරදි ඊටත් වඩා වැඩි වේදනාවක් තුරුළු කර ගන්නට සිද්ධ වෙනවා.

රැවටීම තුළින්, රවටා ගැනීම් තුළින් මෙන්ම රැවටීම් වලට හසුවීම තුළිනුත් බොහෝ විට අනෙක් පාර්ශවය අපූරුවට ලාභ ලබනවා.

තරුණ කාලෙදි විතරක් නෙවෙයි සමහර අඹු සැමියන් පවා එකිනෙකාවම රවටා ගන්නවාද? එහි කෙළවර භයානක සංසිද්ධියක මුල වෙන්න පුළුවන.

සමහරු ව්‍යාපාර ලෝකය තුළ රැවටීම් වලට හසුවෙනවා. ව්‍යාපාර හා සම්බන්ධ වෙන හවුල් කරුවන්ගේ, ගණුදෙනු කරුවන්ගේ රැවටීම්වලට ලක්වෙනවා. මේ තුළින් බොහෝ විට නොවුණත් රැවටීම් වලට ලක්වෙන පුද්ගලයා පාඩු ලබනවා.

පසුගිය සති කීපය මුළුල්ලේම මහත් ආන්දෝලනයකට තුඩු දුන් සක්විති රණසිංහ නම් ඉංග්‍රීසි ගුරුවරයා කොයි තරම් පිරිසක් රැවටීමට, මුලාවට ලක් කරලා අපූරුවට දැන් රටිනුත් පැනලා ඉන්නෙ අනිත් මිනිස්සුන්ගෙ සල්ලි වලින් තමන්ගෙ මළු පුරවගෙන. වැඩි ලාභයක් ලබන බලාපොරොත්තුවෙන් ඔහු ළඟ මුදල් තැම්පත් කළ පිරිස විතරක් නෙවෙයි රටේ බහුතරයකගෙ ගෞරවාදරයට පාත්‍ර වෙලා හිටිය එඩ්වින් ආරියදාස මහත්මයා පවා අද ඒ තුළින් දැඩි අපහසුතාවයකට පත්වෙලා. එතනදි එක් පුද්ගලයෙකුට රැවටුණේ සිය ගානක් උදවිය.

ඒත් අපේ අය මේ රැවටීම්වලින් මිදෙනවා වෙනුවට වෙන්නෙ කොයි පැත්තකින් හරි තව තවත් රැවටීම් වලට හසුවෙන එක විතරයි.

හුඟාක් වෙලාවට මිනිස්සු හිතන්නෙ හුගතුන්ව රවටන එක ලේසියි කියලයි. නමුත් ඒක සැබෑවක් නෙවෙයි. උගත් නූගත් භේදයකින් තොරව, අනෙකාගේ දක්ෂතාවය මත රැවටීම් වලට හසුවන මිනිසුන් වගේම තමන්ගෙ දක්ෂතාවය මත රැවටීම් වලට හසු නොවී බේරී සිටින මිනිසුන් ගැනත් අපිට අසන්නට ලැබෙනවා. පසුගිය සතියෙ දිනපතා දිවයින් පුවත් පතකින් කියවන්නට ලැබුණු මේ සිද්ධියත් මේ ලිපියට ඇතුළත් කරන්න හිතුවෙ හැමදාම රැවටෙන අපේ මිනිස්සු ගැන අප අනුකම්පා කළ යුතුද යන්න දෙවරක් සිතීමටයි.

ඔහු ඉංජිනේරුවරයෙක්. බිරිඳත් සැලකිය යුතු රැකියාවක නියුතු කෙනෙක්. 'තමන්ගේම පවුලේ අයවලුන් මෙන් ජීවත් විය හැකි යුවලක්' සොයා ඔවුන් පුවත් පතකට දැන්වීමක් යොමු කොට තිබුණා. එම දැන්වීම පළවූ දවසෙම දුරකථනයෙන් කතා කළ තරුණයෙකුව එම ඉංජිනේරුවරයා දුරකථනයෙන්ම කළ කථා බහ අතරතුර පරීක්ෂණයකට ලක් කොට තිබුණා. පසු දින ඉංජිනේරු මහතාගේ නිවසට බිරිඳත් සමඟ පැමිණෙන බවට පොරොන්දු වී තිබූ ඔහු, තමන්ගේ අවංක කමට සාක්ෂි වශයෙන් නියමිත වේලාවට කලින්ම එහි ගොස් තිබුණා. තවත් කථා බහ කිරීමෙන් අනතුරුව තරුණයාගෙ ජාතික හැඳුනුම් පත පිළිබඳව විමසුවිට එය නැති වී ඇතැයි කියමින් ලැමිනේට් කළ ග්‍රාමසේවා සහතිකයක් ඔහු ඉදිරිපත් කළ විට ඉංජිනේරුවරයා එම ග්‍රාමසේවා සහතිකයේද ඔහුගේ බිරිඳ යැයි කියූ තැනැත්තියගේ පුද්ගල හැඳුනුම්පතේද ඡායා පිටපත් ලබා ගැනීමෙන් අනතුරුව තරුණයාගේ බිරිඳද හවුල් වීමෙන් පසු දවල් කෑම වේලෙන් අනතුරුව මාතර පිටත් කොට තිබුණා. (ඉංජිනේරුවරයා මේ යුවළ තෝරාගෙන තිබුනේ මාතර වසන තම දෙමව්පියන් සමග ඔවුන්ගේ දුක සැප බලාගෙන සේවය කරන්නටයි.) කෙසේ වෙතත් බොහෝ ආදරයෙන් මෙම සේවක යුවළ පිළිගත් ඉංජිනේරුවරයාගෙ මහළු දෙමව්පියන් ඔවුන්ට දරු සෙනෙහසින් සලකද්දී ඔවුන්ද එම දෙමව්පියන්ට තමන්ගේ දෙමව්පියන් මෙන් සලකා තිබුණා. ලැබුණු පළමු ඇමතීමෙන්ම තමන්ට ගැළපෙන යුවළ වැඩි කරදරයකින් තොරව හමුවීම හේතුකොට ගෙන ඉංජිනේරුවරයා සහ බිරිඳද ඔළුවේ පැටවී තිබූ විශාල බරක් බිම තැබුවා වැනිව සැහැල්ලු වී තිබුණා. නිතර දෙවේලේ මාතරට කතා කොට දෙමව්පියන්ගේද සේවකයන් ලෙස සැලකූ තරුණ යුවළගේද දුක සැප විමසන ඉංජිනේරුවරයා දෙතුන් මසක් අවෑමෙන් කතා කළ පසුගිය දිනෙක දුරකථනයට පිළිතුරු දීමට කිසිවෙකු ඉදිරිපත් නොවීම නිසා නැවත නැවත හත් අටවතාවක්ම උත්සහ කළද වෑයම නිශ්ඵල වූ තැන අසල් වැසි නිවසක මහත්මයෙකුට කතා කොට උදව් ඉල්ලා තිබුණ ඔහු ඒ නිවසට යන විට අඩක් වැසූ දොරවල් අතරින් දැක තිබුණේ මහළු යුවළ සිහිසන් නොමැතිව පසුවන ආකාරයයි.

ඉංජිනේරුවරයාගේ පවුලේ විශ්වාසය දිනාගත් යුවළ මාස දෙක තුනක් විශ්වාසය රැකෙන පරිදි කටයුතු කර අවසානයේදී ඔවුන්ගේ අරමුණ ක්‍රියාත්මක කොට තිබුණේ දෙමව්පියන් සිහි මූර්ජා කොට නිවසේ තිබූ මුදල්, රත්‍රන් බඩු සහ ලක්ෂ ගණනක දේපලද කොල්ලකා පළා යමිනුයි. ඔවුන් සොයන්නට වෙහෙසෙන පොලීසියද පවසන්නේ ඔවුන්ගේ ලිපිනයට අනුව එහි ඔවුන් පදිංචිව සිට ඇත්තේ මීට බොහෝ කාලයකට පෙර බවයි.

මහළු දෙමව්පියන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට කෙනෙකු තෝරා ගත් කළ වඩාත් විමසිල්ලෙන් ඔහුගේ ලිපිනය හා ග්‍රමසේවා සහතිකයද ව්‍යාජ නොවන බව සැකහැර දැනගන්නට තරම් නුවණක් ඉංජිනේරුවරයාට තිබුණානම් එකපාරටම විශ්වාස කරනවා වෙනුවට දෙවරක් අවිශ්වාස කරන්නට සිතුනා නම් ඔහුට අත්විඳින්නට සිදු වූ ව්‍යසනය කල් තියාම දැන ගන්නටත් තිබුණා.





රංජිත් රූබි සමඟ පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු

Voice of Lanka
97.7FM 3SER

FM 94.1
ලක් මිහිර South

අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න